www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලේමන් බ්‍රදර්ස් බිඳ වැටීමෙන් වසරක් ගිය තැන

## One year since the collapse of Lehman Brothers

2009 සැප්තැම්බර් 15

වසරකට පෙරාතුව අද වැනි දිනෙක, වසර 158 ක් පැරනි හා එක්සත් ජනපදයේ සිව් වැනි විශාලතම ආයෝජන බැංකුව වූ ලේමන් බ්‍රදර්ස් හි බිඳ වැටීම, සමස්ත ගෝලීය මූල්‍ය පද්ධතියම වෙලාගැනීමේ තර්ජනය මතුකල කුනාටුවක් මුදා හලේය.

එයින් දින දෙකකට පසුව, ඇමරිකන් ඉන්ටර්නැෂනල් ගෲප් (ඒඅයිජී) යන යෝධ රක්ෂන සමාගමට එක්සත් ජනපද ආන්ඩුව බිලියන 85 ක් ඇප දීමත්, ඉන් පසුව එලඹුන සතිවල ජාත්‍යන්තර මුදල් වෙලඳපොලෙන් ඩොලර් ට්‍රිලියන 3.6 ක් පලා යාමත් දැකිය හැකි විය. ගෝලීය ධනේශ්වර ආර්ථිකයට ද්‍රවශීලතාව සම්පාදනයකරන වානිජ්‍ය නෝට්ටු වෙලඳපොලට අපස්මාරය වැලඳුනි. බැංකු හා මූල්‍ය ආයතන තමන්ගේ මුදල් පෙට්ටි බදා ගත්තේ, ඒවා තමන්ටම අවශ්‍ය වේ යයි හෝ තමන් මුදල් නයට දුන් ගනුදෙනු කරුවන් බිඳවැටේ යයි බියට පත්වීමෙනි.

අර්බුදයේ ක්ෂනික මූලයන් පැවතුනේ, 2007 වසර ආරම්භයේදී එක්සත් ජනපද උකස්කර මූල්‍ය වෙලඳපලේ වැටීම තුලය. දශකයේ පූර්ව වසරවල, ලාභ නය මඟින් දහනය කල නිවාස බුබුලෙන් පසුව මෙය සිදු විය. උකස්කර වලින් පිටුබලය ලත් සුරැකුම් මිලට ගැනීම හා විකිනීම වෝල් වීදියේ බැංකු හා ආයෝජන ආයතන වලට පෙර නොවූ විරූ වැදගත්කමක් දැරීමට පටන් ගත්තේ, එන්ට එන්ටම අවදානම් සහිත ආයෝජන මත පදනම්වූ ඊනියා ''අවමුඛ'' වෙලඳපොල ඉමහත් ලෙස ප්‍රසාරනය වීමට තුඩු දෙමිනි.

නිවාස බුබුලේ අවසානය වෝල් වීදියට බලපෑවේ, 2007 අගෝස්තුවේ කොටස් වෙලඳපොලෙහි තියුනු පිරිහීමක රූපයෙනි. එක් අවස්ථාවක දී අනාවැකි පලකොට තිබුනේ එක් දිනක් තුල ඒකක 1000 ක් වැටෙනු ඇතැයි කියාය. ඒ, එක්සත් ජනපද උකස් වෙලඳපොලට දැඩි ලෙස නිරාවරනය වී තිබුනු ජර්මන් බැංකු දෙකකට ඇප දී මුදාගැනීමත් සමඟ, අර්බුදය ජාත්‍යන්තරව පැතිරී යාමට පටන් ගනිද්දී ය.

1987 ඔක්තෝබරයේ වෝල් වීදියේ බිඳ වැටීම, 1997 ආසියානු ආර්ථික අර්බුදය, 1998 දිගුකාලීන ප්‍රාග්ධන කලමනාකරන සමාගමේ ඇද වැටීම හා 2001 ඩොට් කොම් බුබුල පුපුරා යාම වැනි පූර්ව මූල්‍ය කුනාටුවල දී සිදුකල ආකාරයට එක්සත් ජනපද මහ බැංකුව මෙයට මැදිහත් වූයේ, පොලී අනුපාතික කපා හරිමින් හා නය කොන්දේසි ලිහිල් කරමිනි. එහෙත් මෙවර එවන් පියවර අර්බුදය තුරන් කිරීමට සමත් වූයේ නැත.

ඉන් පසුව එලඹි මාසවල, මූල්‍ය වෙලඳපොලවල ගැටලු එක දිගට නරක අතට හැරුනු අතර, 2008 මාර්තුවේදී එක්සත් ජනපද ආන්ඩුව, බෙයාර් ස්ටියර්න්ස් ආයෝජන බැංකුව ජේපී මෝර්ගන් චේස් විසින් අත්පත් කර ගැනීමේ ඩොලර් බිලියන 30 ක මෙහෙයුම දියත් කිරීමත් සමගම පුපුරා ගියේය. බෙයාර් ස්ටියර්න්ස්, එක්සත් ජනපදයේ දෙවන විශාලතම උකස් බැඳුම්කර ප්‍රතිග්‍රාහකයා වූ අතර එය, පූර්ව වර්ෂයේ ජුලි මාසයේ සිය ආරක්ෂිත අරමුදල් දෙකක අසාර්ථකත්වයෙන් පහර කා සිටියේය. නය හිමියන්ගේ ඉල්ලීම් ඉටුකිරීමට අවශ්‍ය තරම් මුදල් සංචිත එය සතුව නැතැයි බියක් ඒ වන විට පලවෙමින් තිබුනි.

මාර්තු 18 වන දින ලෝක සමාජවාදී වෙබ් අඩවි කර්තෘ මන්ඩල ප්‍රකාශනයක්, බෙයාර් ස්ටියර්න්ස් බිඳ වැටීමේ ඇඟවුම් ගෙනහැර දැක්වීය. ''එලඹෙන සති කිහිපය තුල වෝල් වීදියට මෙහි බලපෑම කුමක් වුවත්, දැන් දිග හැරෙමින් ඇත්තේ ඓතිහාසික පරිමාන අර්බුදයක්ය යන්න ගැන ප්‍රශ්නයක් තිබිය නොහැකිය. ධනේශ්වර වෙලඳපොලේ අනභිබවනීයත්වය හා වෝල් වීදියේ මූල්‍ය පන්ඩිතයන්ගේ ප්‍රතිභාවය ගැන අතොරක් නැතිව කරන ලද මාධ්‍ය ප්‍රචාරනයේ පරම්පරාවකටම පසුව, එක්සත් ජනපද ආර්ථිකය දැන් සිටින්නේ, මහා අවපාතයෙන් පසුව නොදුටු පරිමානයේ ආර්ථික අර්බුදයක අද්දරය.''

යන්තම් සය මසක් යාමටත් පෙර මෙම අනතුරු ඇඟවීම සනාථ විය.

2008 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල පැනනැගි අර්බුදය, එක්සත් ජනපද පාලනාධිකාරය ද, ලොව පුරා ආන්ඩු විසින් ද, පෙර නොවූ විරූ පරිමානයක ඇප දීමේ මෙහෙයුමක් මුදාහැරීමේ ආරම්භය විය. මූල්‍ය පද්ධතිය නඟා සිටුවීම සඳහා දැවැන්ත අරමුදල් එන්නත් කරන අතර තුර, - එක්සත් ජනපදය පමනක් තමන්ගේ සියලු පොරොන්දු ක්‍රියාවට නැඟුවහොත් එය ඩොලර් ට්‍රිලියන 23.7 ක් වනු ඇත. - එය තැරැව් කලේ, ආර්ථික ව්‍යසනයක් වැලැක්වීමේ මාධ්‍යයන් ලෙසය. ආරම්භයේ පටන්ම මෙම මෙහෙයුම සංවිධානය කල ආකාරය

අනුව හෙලිදරව් වී ඇත්තේ, එහි මූලික අරමුන මොන වියදමකින් හෝ අති බලගතු මූල්‍ය ආසක්තයන් ආරක්ෂා කිරීම බවය.

ආරම්භක සැලසුම් පිලියෙල කරන ලද්දේ, එවකට එක්සත් ජනපද භාන්ඩාගාරයේ ලේකම්ව සිටි, ගෝල්ඩ්මන් සැක්ස්හි හිටපු ප්‍රධාන විධායක හෙන්රි පෝල්සන්ගේ නායකත්වයෙන්, නිව් යෝර්ක්හි මහ බැංකු කාර්යාලය තුල රැස්වුනු කුඩා කන්ඩායමක් විසිනි. ඊට සහභාගී වූවන් අතර, වත්මන් එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම් තිමෝති ගෙයිට්නර් - ඔහු එවකට නිව් යෝර්ක් මහ බැංකුවේ සභාපති විය - හා ගෝල්ඩ්මන් සැක්ස්හි ප්‍රධාන විධායක ලොයිඩ් බ්ලැන්ක්ෆියන් ද විය.

ඉන් පසුව එලඹි සතිවල නිතර අසනු ලැබූ ප්‍රශ්නය වූයේ, ලේමන් බ්‍රදර්ස් බැංකුවට ඇපදීම ප්‍රතික්ෂේප කර යන්තම් දෙදිනක් ගතවෙත්ම ඒඅයිජී වෙත බිලියන 85 ක ජීව රුධිරය ලබාදුන්නේ කුමක් නිසා ද? යන්නයි. එවකට හොඳින් නොදැන සිටිය ද, ගෝල්ඩ්මන් සැක්ස්, ඒඅයිජී හි ප්‍රධානම වෙලඳ සහකරුවූ අතර යෝධ රක්ෂන සමාගම බිඳ වැටුන හොත් එයට අඩුම තරමින් ඩොලර් බිලියන 20 ක අලාභයක් සිදුවීමට තිබුනි.

ආරම්භක හදිසි රැස්වීම් වලදී, පසුව අනුගමනය කල යුතු රටාව ස්ථාපිත කරන ලදී. එනම්, ආන්ඩුවේ නිලධාරීන් අවශ්‍ය මූල්‍ය හා නීති සම්පාදනයේ කටයුතු සිදු කරන අතර, බැංකු සඳහා බැංකු විසින් ම ඇපදීම් සංවිධානය කල යුතුය.

ගෝලීය මූල්‍ය අර්බුදය ආරම්භයේ පටන්ම හා ගෝලීය කාර්මික නිෂ්පාදනය, ලෝක වෙලඳම හා ව්‍යාපාර වස්තු මිල ගනන් වල මේ වසරේ ජූනි දක්වාම සිදුවූ පහත වැටීම, එයට සමානුපාතික 1929 හා 1930 අතර කාලයට වඩා දැවැන්ත වූ, 1930 ගනන් වලින් පසුව ඇතිවූ ගැඹුරුම පසුබෑමේ පසුතලයෙහි සිට ප්‍රධාන ආන්ඩු, ගෝලීය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 18 කට සමානවේ යයි ගනන් බලා ඇති ඩොලර් ට්‍රිලියන ගනනින් බැංකු ඇපදීම් හා උත්තේජක වැඩ සටහන් සඳහා වැයකර තිබේ.

මෙය, ව්‍යාපාර වස්තු වෙලඳපොලවල නැගීමක ද, මූල්‍ය පද්ධතියේ එක්තරා ස්ථාවරත්වයක ද, සියල්ලටත් වඩා බැංකු ලාභවල ඉහල නැගීමක ද රූපයෙන් ''ගොඩඒමක'' සලකුනු පෙන්වා තිබේ. එහෙත්, එක්සත් ජනපදයේ මෙන්ම යුරෝපයේ ද විරැකියාව දැන් සියයට 10 ක ඉමේ පවතින තතු හමුවේ කම්කරු පන්තිය මුහුනදෙන කොන්දේසි එක දිගට නරක අතට හැරෙමින් තිබේ.

ඩොලර් ට්‍රිලියන ගනන් වැයකර තිබුන ද, අර්බුදයට තුඩුදුන් පතුලේ පැවති එකදු ගැටලුවක් හෝ විසඳී නැත. වගකිවයුතු කිසිවෙකුටත් ඒ සඳහා චෝදනා ඉදිරිපත් කොට නැතුවාක් මෙන්ම කඩාවැටීමට තුඩුදුන් එම මූල්‍ය ක්‍රමවේදයන්ම තවදුරටත් යොදාගැනේ.

අර්බුදය විසඳ ඇත්තේ නැත. සිදුව ඇති එකම දෙය, බැංකු හා මූල්‍යායතන සතු දැවැන්ත නය හා ''විෂ සහිත'' වත්කම්, මූල්‍ය ප්‍රභූ තන්ත්‍රයේ විධායක කමිටුව ලෙස වැඩ කරන ධනේශ්වර රාජ්‍යයේ පොත්පත් වලට ඇතුලත් කර ගැනීම පමනකි. දැන් මේ නය ගෙවිය යුතුව ඇත්තේ කම්කරු පන්තියේ සමාජ තත්වයන් මත පුලුල්ම ප්‍රහාරයන් එල්ල කිරීම හරහාය.

''පිටවීමේ මූලෝපායක්'' සූදානම් කිරීමේ අවශ්‍යතාවය ගැන මෑතකදී කල කථාවකදී සඳහන් කරමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කලමනාකාර අධ්‍යක්ෂ ඩොමිනික් ස්ට්‍රාවුස් කාන්, දැන් ක්‍රියාවට නැගිය යුතු න්‍යාය පත්‍රය ගෙනහැර දැක්වීය. ''අතිශයින්ම වැදගත් පියවර වන්නේ විශ්‍රාමික හා සෞඛ්‍ය සේවා වියදම් මත පාලනයක් ඇති කිරීමයි. මෙම ක්ෂේත්‍රයෙහි වියදම් කැපීමේ ප්‍රතිසංවිධාන කටයුතු දේශපාලනිකව දුෂ්කර වන නමුත්, මූල්‍ය තිරසර භාවය සුරක්ෂිත කිරීම සඳහා මේ දේ අත්‍යවශ්‍ය ය.''

මෙම වැඩපිලිවෙල දැනටමත් ක්‍රියාවට නඟා තිබේ. එක්සත් ජනපදය තුල, මෝටර් රථ කර්මාන්තය ''ප්‍රතිව්‍යුහගත'' කිරීමෙන් අනතුරුව ඔබාමා පරිපාලනය, සෞඛ්‍ය පහසුකම් කපාහැරීම වෙත යොමුවී සිටියි. බ්‍රිතාන්‍යයේ එලඹෙන මැතිවරනයෙන් කුමන පක්ෂයක් බලයට පත්වුවත්, දැවැන්ත පරිමානයේ වියදම් කප්පාදුවක් සිදුවනු ඇත. ලංඩනයේ පලවන *ෆිනෑන්ෂල් ටයිම්ස්* හි මෑතක පලවූ ලිපියක අවධාරනය කර ඇත්තේ, බ්‍රිතාන්‍ය තුල පරිභෝජනය 2006-07 තිබූ මට්ටම් වලින් සියයට 20 කින් පහත හෙලිය යුතු බවයි. නිල වශයෙන් පසුබෑමකට ඇතුල්වී නැති ඕස්ට්‍රේලියාවේදී, අයවැය හිගය පහත හෙලීමට කැපවී සිටින රඩ් ගේ ලේබර් ආන්ඩුව, ''ගොඩඒමේ වේදනාව'' පිලිබඳව අනතුරු අඟවා ඇත.

''ගොඩඒම'' හා ''ආපසු හැරීම'' පිලිබඳ නිල ''හොරනෑව'' කෙසේ වෙතත්, මනා ඉදිරිදැක්මක් සහිත ප්‍රකාශකයන් සඳහන් කර ඇත්තේ, කිසිවක් විසඳ නැති අතර තවත් බිඳවැටීමක අනතුර වැඩිවෙමින් ඇති බවය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හිටපු අර්ථශාස්ත්‍රඥ සයිමන් ජොන්සන්ට අනුව, මූල්‍ය පද්ධතියේ දැනට සිදුවෙමින් ඇති හෝ මේසය මත ඇති ''ප්‍රතිසංස්කරන'' ඉතා ස්වල්පයකි. ''යථාර්තයේ කරුනු කාරනා'' සරලය, ඔහු සඳහන් කරයි. ''අපගේ බැංකු හා ඒවායේ 'නව මූල්‍යමය ආරම්භකත්වයන්'

ගේ දත් උගුල්ලා නැත. සැබවින්ම ඒවා බෙහෙවින් අනතුරුදායක බවට පත්වෙමින් තිබේ. දෙවන මහා අවපාතයකට කොතෙක් සමීප වී දැයි අප ඉගෙනගත් අතර, අප ජීවත් වන්නේ ඉමහත් අර්බුදයක් තුලය. එහෙත් දැන් සිදුවන කිසිවකින් අනාගතයේදී ඒහා සමාන යමක් පුනර්කරනය වීම වලකාලන්නේ නැත.''

වසරක් ඉකුත්ව ගොස් තිබිය දී කම්කරු පන්තිය මේ අර්බුදයෙන් අවශ්‍ය පාඩම් උකහාගත යුතුය. ආර්ථික සිදුවීම්වල ක්ෂනික ගමන්මග කුමක් වුවත්, එය දේවල් තමන්ගේම අතට ගෙන තම හිසට උඩින් ලඹදෙන ව්‍යසනයේ තර්ජනය උපුටා දැමීමට පියවර ගත යුතුය.

ධනේශ්වර රාමුව තුල මෙම ඓතිහාසික අර්බුදයට තර්කානුකූල විසඳුමක් තිබිය නොහැකිය. ලාභ පද්ධතියට අවසන් තිත තැබීමෙන්ද සියතෙහි දේශපාලන බලය කැටිකරගෙන සිටින මූල්‍ය කතිපයාධිකාරය පෙරලා දැමීමෙන්ද පමනක්, සැලසුම්ගත ලෝක සමාජවාදී ආර්ථිකයක් පිහිටුවීම හා අනාගතය සුරක්ෂිත කල හැකිවනු ඇත. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේත්, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේත්* ඉදිරිදර්ශනය වන්නේ මෙයයි.

**නික් බීම්ස්**

© www.wsws.org